**සීමාසහිත බී.සී.සී. ලංකා සමාගම**
**මිරානියා මාවත, තැ.පෙ. 281, කොළඹ 12.**

සීමාසහිත බී.සී.සී. ලංකා සමාගමේ පසුබිම වර්ෂ 1918 දක්වා දිවයන අතර, යුරෝපා ජාතික ආයෝජකයින් විසින් බ්‍රිටිෂ් සිලෝන් මිලිං සමාගම සිලෝන් එක්ස්ට්‍රැක්ෂන් සමාගම පිහිටවන ලද අතර,1972 පෙබරවාරි මස 25 වන දින එවකට පැවති රජය විසින් 1971 අංක 35 දරණ ව්‍යාපාර අත්පත් කර ගැනීමේ පනත යටතේ රජයට පවරා ගන්නා ලදී. පසුව 1976 දී සිලෝන් එක්ස්ට්‍රැක්ෂන් සමාගම සිය ව්‍යාපාර කටයුතු නවතා දමන ලදී.

දැනට පවතින සීමාසහිත බීසීසී ලංකා සමාගම 1988 ඔක්තෝම්බර් මස 21 වන දින සංස්ථා හා රාජ්‍ය සතු සමාගම්, සමාගම් බවට පරිවර්තනය කිරීමේ 1982 අංක 23 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලදී. මෙම පරිවර්තනය ගැසට් නිවේදනයක් මගින් 1988 නොවැම්බර් මස 04 වන දින ප්‍රකාශ කරන ලද අතර නව බීසීසී සමාගමේ කටයුතු 1988 දෙසැම්බර් මස 06 වන දින සිට නැවත ආරම්භ කරන ලදී.

**ක්‍රියාකාරකම්**

සබන් නිෂ්පාදන සහ පොල් තෙල් ආශ්‍රිත නිෂ්පාදන, විෂබීජ නාශක දියර, සුවඳ සබන්, රෙදි සෝදන සබන්, සහ අනෙකුත් නිෂ්පාදන වෙළදාම හා බෙදාහැරීමයි.

**සම්බන්ධවිය හැකි පුද්ගලයන්**

| නම | දුරකථන අංකය | ෆැක්ස් | ඊ - මේල් |
|---|---|---|---|
| සභාපති, එස්.ඒ.ආර්. මද්දුම බණ්ඩාර මහතා | 2435195<br>077 - 3000900 | 2447139 | bcc@asianet.lk |